# ලිසිනිගේ උපන්දින තෑග්ග





බී. එම්. රිසලි ජනින්දී කුමාරිහාමි බණ්ඩාරනායක

# ලිසිනිගේ උපන්දින තෑග්ග

**බී. එම්. රිසලි ජනින්දි කුමාරිහාමි**

**බණ්ඩාරනායක**

**මහ/මහාමායා බාලිකා විදුහල**

**3 ශ්‍රේණිය B**

**2026.05.10**

**978-624-208-941-6**

# පිදුම

මගේ ආදරණීය මහාමායා බාලිකාවටත්

පන්තිභාර ගුරු මෑණියන්ට සහ

ආදරණීය දෙමව්පියන්ටත්

මගේ පොත ගෞරවයෙන් පුදමි



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයක්ග්‍රහණයෙකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන් වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
**2026-05-10**

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.


ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව

2026.05.10

ලිසිනි හොඳ  ළමයෙක්.

ඇය පාසලේ වැඩවලට දක්ෂයි.

පාසලේ ගුරුතුමියත් ලිසිනිට ආදරෙයි.

ලිසිනි යහළුවන්ට උදව් කරනවා.

නිවසේදීත් ඇය අම්මාටත් තාත්තාටත් උදව් කරනවා.

ඒ නිසා අම්මයි තාත්තයි ලිසිනිට හරිම ආදරෙයි.



ලිසිනිගේ උපන්දිනය ළඟ ළඟම එනවා.

සෑම උදෑසනකම අවදි වුනාම ලිසිනි හිතනවා,

“මට ලස්සන තෑග්ගක් ලැබේවි ” කියලා

“අම්මයි තාත්තයි මට ලස්සන තෑග්ගක්

ගෙනත් දෙයි” කියලා ඇය සතුටින් සිටියා.



එක් දවසක ලිසිනි අම්මාගෙන් ඇසුවා,

“අම්මේ, මගේ උපන්දිනය දවසේ මොනවද

කරන්නේ? ” කියලා.

අම්මා කිව්වා,

“උදේට පන්සලට දානය අරගෙන යමු.

ලොකු හාමුදුරුවන්ට කියලා පිරිත් දේශනා

කරලා ආශිර්වාද ලබා ගනිමු.

සවසට යහළුවන්ට එන්න කියලා උපන්දින

සාදයක් තියමු” කියලා

ලිසිනිට හරිම සතුටු හිතුණා.

ලිසිනිගේ උපන්දින දවස ආවා.

අම්මා උදේම දානය සූදානම් කළා.

තාත්තාත් ලිසිනිත් අම්මාට උදව් කළා.

ඔවුන් දානය රැගෙන පන්සලට ගියා.

හාමුදුරුවෝ ලිසිනිට ආශිර්වාද කළා.



උපන්දින සාදයට නිවස ලස්සනට සැරසුවා.

තාත්තා බැලුම් එල්ලුවා.

අම්මා රස කැවිලි හදලා තිබුණා.

තාත්තා ලිසිනිට ලස්සන ගවුමක් දුන්නා.

ලිසිනි ඒ ගවුම ඇඳගෙන සතුටු වුණා.

යහළුවෝත් තෑගි රැගෙන උපන්දින සාදයට ආවා.

අම්මගෙනුත් තාත්තගෙනුත් ලිසිනිට ලස්සන බයිසිකලයක් තෑගි ලැබුණා.

ලිසිනිට හරිම සතුටුයි.

ඇය යහළුවන් සමඟ බයිසිකලය පදිමින් සෙල්ලම් කළා .

ලිසිනි වගේම යහළුවෝ උපන්දිනය දවසේ හොඳට සතුටු වුණා.

යහළුවෝ බයිසිකලේ ගැන කතා වුණා.



ලිසිනි යහළුවෝ සමඟ සෙල්ලම් කිරීමට

ගෙදරින් යන්නේ අම්මාට කියලා.

අම්මාට කියන්නේ නැතුව කොහේවත්ම

යන්නේ නැහැ.

නමුත් එක දවසක සැන්දෑවක යහළුවෝ

ඇවිත්,

“බයිසිකල් පදින්න යමු ” කියලා කීවා.

එදා ලිසිනිට බයිසිකලේ පැදීමට තිබූ ආසාව

නිසාම අම්මාට කියලා යන්න අමතක වුණා.

ඇය බයිසිකලය රැගෙන යහළුවන් සමඟ

සෙල්ලම් කිරීමට ගියා.



යහළුවෝ කිව්වා “පොකුණ බලන්න යමු” කියලා.

ලිසිනි යන්න බය වුණා.

ඒත් යහළුවෝ යන්න කැමති වුන නිසා ලිසිනිත් ගියා.

පොකුණට යන පාර දෙපස අඹ ගස්වල අඹ පිරී තිබුණා.

යහළුවෝ බයිසිකල් වලින් බැස අඹ කඩාගෙන කෑවා.

සියලු දෙනාම සතුටු වුණා.



පාරේ යන විට හදිසියේ සතෙකුගේ කෑ ගසන හඬක් ඇසුණා.

යහළුවෝ බය වුණා.

බයිසිකල් වේගයෙන් පැදීමට පටන් ගත්තා.

ලිසිනිත් බයිසිකලය වේගයෙන් පදින්න පටන් ගත්තා.

ලිසිනිගේ බයිසිකලය ගසක මුලකට වැදී, ලිසිනිත් එක්කම බිම වැටුණා .

ලිසිනිගේ දණහිස තුවාල වෙලා.

ඇය අඬන්න පටන් ගත්තා.

යහළුවෝ ලිසිනිව දමා නොගියා.

බයිසිකලයත් තල්ලු කරමින් ලිසිනිවත් අතින් අල්ලාගෙන නිවසට එක්කගෙන ආවා.



නිවසට එන විට අහස ටිකක් කළුවර වෙලා.

ලිසිනිගේ අම්මාත් ලිසිනිව සොයනවා.

අම්මාත් හොඳටම බය වෙලා ලිසිනි නැතුව.

ලිසිනි අඩ අඩා අම්මා ළඟට ගියා.

අම්මා ඇසුවා,

"මට කියන්නේ නැතුව බයිසිකලයත්

අරගෙන කොහෙද ගියේ?" කියලා.

ලිසිනියි යහළුවොයි සිදු වූ දේ අම්මාට කිව්වා.

හොඳ යහළුවෝ ගැන අම්මා සතුටු වුණා.

අම්මා කිව්වා,

"අම්මාට නොකියා කොහේවත් යන්න එපා"

කියලා.

ලිසිනි අම්මාගෙන් සමාව ගත්තා.

“ආයෙත් මම අම්මාට කියන්නේ නැතුව කොහේවත්ම යන්නේ නැහැ” කියලා ලිසිනි කීවා.

අම්මා,

“මගේ හොඳ දුව” කියමින් ලිසිනිට ආශිර්වාද කළා .





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනාඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් “හේමමාලා උපහාර” ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද දියවඩන නිලමතුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

**978-624-208-941-6**